# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2365/33 - 2024 ජනවාරි මස 03 වැනි බදාදා - 2024.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත**

4 (2) වගන්තිය යටතේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙතැන් සිට ආයතනය ලෙස හැඳින්වේ) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන පනතේ අරමුණු සඳහා මෙහි ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වෙනස්කිරීම් 2024, 2024 ජනවාරි 1 හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේද සඳහා බලාත්මක වේ. මෙම ප්‍රමිතිය 2024 ජනවාරි 1 හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේද සඳහා බලාත්මක වේ.

පාලක සභාවේ නියෝගය අනුව,

**ආර්. එස්. අනෝමා ප්‍රියදර්ශනි,**
**ලේකම්.**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය,
අංක 30ඒ, මලලසේකර මාවත,
කොළඹ 07.
29 පෙබරවාරි, 2024.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2024 ජනවාරි 01 සිට බලාත්මක වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට වෙනස්වීම්

## පටුන


[1] මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව
[2] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 1 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීම (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර)
[3] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 2 - කොටස් පදනම් ගෙවීම
[4] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 3 - ව්‍යාපාර සංයෝජන
[5] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 4 - රක්ෂණ ගිවිසුම්
[6] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 5 - විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්
[7] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 6 - ඛණිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම
[8] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 - මූල්‍ය සාධනපත්‍ර : හෙළිදරව් කිරීම
[9] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 8 - මෙහෙයුම් ඛණ්ඩ
[10] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 - මූල්‍ය සාධනපත්‍ර
[11] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන
[12] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 11 - බද්ධ සැකසුම්
[13] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 12 - වෙනත් අස්තිත්ත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම
[14] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 13 - සාධාරණ අගය මැනීම
[15] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 14 - නියාමන විලම්භන ගිණුම්
[16] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 - ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය
[17] ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 16 - කල්බදු
[18] ශ්‍රී.ලං.ගි. ප්‍ර 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
[19] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 2 - තොග
[20] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශ
[21] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි
[22] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්
[23] ශ්‍රී.ලං.ගි. ප්‍ර–12 - ආදායම් බදු
[24] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 16 - දේපල, පිරියත සහ උපකරණ
[25] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 19 - සේවක ප්‍රතිලාභ
[26] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 20 - රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම
[27] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 21 - විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම්වල බලපෑම
[28] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 23 - ණය ගැණුම් පිරිවැය
[29] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 24 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම
[30] ශ්‍රී.ලං.ගි. ප්‍ර.-26 - විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය
[31] ශ්‍රී.ලං.ගි. ප්‍ර–27 - වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන
[32] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 28 - ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන
[33] ශ්‍රී.ලං.ගි. ප්‍ර.-29 - අති උද්ධමනකාරි ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරණය
[34] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 32 - මූල්‍ය සාධන පත්‍ර : ඉදිරිපත් කිරීම
[35] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 33 - කොටසක ඉපැයුම්
[36] ශ්‍රී.ලං.ගි. ප්‍ර.34 - අතුරු මූල්‍ය වාර්තාකරණය
[37] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 36 - වත්කම් හානිකරණය

**[38] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 37 - ප්‍රතිපාදන, අසම්භාවය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**

**[39] ශ්‍රී.ලං.ගි. ප්‍ර.-38 - අස්පෘශ්‍ය වත්කම්**

**[40] ශ්‍රී.ලං.ගි. ප්‍ර.-39 - මූල්‍ය සාධන පත්‍ර : හඳුනා ගැනීම සහ මැනීම**

**[41] ශ්‍රී.ලං.ගි. ප්‍ර. 40 - ආයෝජන දේපළ**

**[42] ශ්‍රී.ලං.ගි. ප්‍ර.- 40 - කෘෂිකර්මය**

| **සංශෝධන** | **සංශෝධිත ප්‍රමිත** |
|---|---|
| ජංගම නොවන ලෙස වගකීම්වල වර්ගීකරණය - ශ්‍රී.ලං.ගි. ප්‍ර. 1 ට සංශෝධනය | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 |
| විකිණීම සහ නැවත කල්බද්දකට ගැනීමක් තුල කල්බදු වගකීම - ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 16 ට සංශෝධනය | ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 16 |
| ගිවිසුම් සමග ජංගම නොවන වගකීම් - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 ට සංශෝධන | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 |
| සැපයුම්කාර මූල්‍ය සැකසුම් - ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට සහ ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 7 ට සංශෝධන | ශ්‍රී.ලං.ගි.ප්‍ර., ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 7 |
| ජාත්‍යන්තර බදු ප්‍රතිසංස්කරණය - කුළුණු දෙකේ ආකෘතිමය රීතිය - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 ට සංශෝධන | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 |

| | |
|---|---|
| **මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 1 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීම (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර)** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 2 - කොටස් පදනම් ගෙවීම** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 3 - ව්‍යාපාර සංයෝජන** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 4 - රක්ෂණ ගිවිසුම්** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 5 - විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 6 - ඛණිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 - මූල්‍ය සාධනපත්‍ර : හෙළිදරව් කිරීම** | |
| 44ඒඒ | ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 මගින් සංශෝධන කළ 2023 මැයි නිකුත් කළ *සැපයුම්කරු මූල්‍ය සැලසුම්හි* ආ11ඊ සංශෝධන කරන ලදී. එය ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7ට සංශෝධන ව්‍යවහාර කරන විට අස්තිත්වයක් එම සංශෝධන කළ යුතුය. |
| ආ11ඊ(ඒ) | දීර්ඝ කරන ලද ගෙවීම් කොන්දේසි සමග අස්තිත්වය හෝ කලින් ගෙවීම් කොන්දේසි සමග අස්තිත්වයේ සැපයුම්කරුවන් සපයනු ලබන *සැපයුම්කරු මූල්‍ය සැලසුම්* යටතේ (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 7 හි උ ඡේදයේ විස්තර කරන පරිදි) පහසුකම්වලට ප්‍රවේශ වී තිබීම හෝ ප්‍රවේශය තිබීම. |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 8 - මෙහෙයුම් ඛණ්ඩ** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 - මූල්‍ය සාධනපත්‍ර** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 11 - බද්ධ සැකසුම්** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 12 - වෙනත් අස්තිත්ත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 13 - සාධාරණ අගය මැනීම** | |
| වෙනස්කම් නොමැත | |

| | |
|---|---|
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 14 - නියාමන විලම්භන ගිණුම්** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 - ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 16 - කල්බදු** | |
| 102අ | ආරම්භක දිනට පසුව, විකුණුම්කරු- කල්බදු ගැණුම්කරු නැවත කල්බද්දට ගැනීමෙන් පැනනගින වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට 29-30 ඡේද සහ එහි නැවත කල්බද්දට ගැනීමෙන් පැනනගින කල්බදු වගකීමට 36-46 ඡේද ව්‍යවහාර කළ යුතුය. 36-46 ඡේද ව්‍යවහාර කිරීමේදී විකුණුම්කරු-කල්බදු ගැණුම්කරු විසින් රඳවාගන්නා වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට සම්බන්ධ ලාභයේ හෝ අලාභයේ ඕනෑම ප්‍රමාණයක් විකුණුම්කරු-කල්බදු ගැණුම්කරු හඳුනා නොගන්නා ක්‍රමයකින් කල්බදු ගෙවීම් හෝ සංශෝධන කළ කල්බදු ගෙවීම් විකුණුම්කරු- කල්බදු ගැණුම්කරු නිශ්චය කළ යුතුය. මෙම ඡේදයේ අවශ්‍යතා ව්‍යවහාර කිරීමෙන් 46(අ) ඡේදය මගින් අවශ්‍ය කෙරෙන කල්බද්දේ සම්පූර්ණයෙන් හෝ කොටසක් අවසන් කිරීමට සම්බන්ධ ලාභය හෝ අලාභය තුල හඳුනාගැනීමෙන් විකුණුම්කරු- කල්බදු ගැණුම්කරු වළක්වනු නොලබයි. |
| ආ1ඈ | *විකිණීම සහ නැවත කල්බද්දට ගැනීමකින් කල්බදු වගකීම* 2022 සැප්තැම්බර් නිකුත් කළ ඇ2 ඡේදය සංශෝධන කර 102අ සහ ඇ20ඉ ඡේද එකතු කරන ලදී. විකුණුම්කරු-කල්බදු ගැණුම්කරු 2024 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධන ව්‍යවහාර කළ යුතුය. කලින් ව්‍යවහාර කිරීමට ඉඩ දෙනු ලැබේ. විකුණුම්කරුගේ - කල්බදු ගැණුම්කරුගේ පෙර කාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධන ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරවු කළ යුතුය. |
| ඇ20ඉ | **විකිණීම සහ නැවත කල්බද්දට ගැනීමකින් කල්බදු වගකීම**<br>මුලින්ම ව්‍යවහාර කරන දිනයට පසු එළඹුණු විකිණීම සහ නැවත කල්බද්දට ගැනීමේ ගණුදෙණුවලට ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 අනුව විකුණුම්කරු - කල්බදු ගැණුම්කරුවෙක් අතීතානුයෝගීව විකිණීම සහ නැවත කල්බද්දට ගැනීමක් තුල (ඇ1ඈ ඡේදය බලන්න) කල්බදු වගකීම ව්‍යවහාර කළ යුතුය. |
| **ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. - 17 රක්ෂණ ගිවිසුම් (තවම බලපැවැත්වෙන නොවන ප්‍රමිත)** | |
| වෙනස්කම් නොමැත | |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. - 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම** | |
| 69 (ඇ) | වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු අඩුම තරමේ මාස 12 සඳහා වගකීම පියවීම කල්දැමීමට වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී එයට අයිතිය නොතිබේ. |
| 72අ | ***අඩුම තරමේ මාස 12 සඳහා වගකීම පියවීම කල්දැමීමේ අයිතිය (69ඇ ඡේදය)***<br>අඩුම තරමේ මාස 12 සඳහා වගකීම පියවීම කල්දැමීමට අස්තිත්වයේ අයිතියට හරය තිබිය යුතු අතර 72ආ- 75 ඡේදවල නිර්දේශ කර ඇති පරිදි වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී පැවැතිය යුතුය. |
| 72ආ | වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු අඩුම තරමේ මාස12 සඳහා ණය එකගවීමකින් පැනනගින වගකීම පියවීම කල්දැමීමට අස්තිත්වයේ අයිතිය එම ණය මුදලේ සැලැස්මේ විශේෂයෙන් සඳහන් පරිදි කොන්දේසි සමග එකඟවෙමින් අස්තිත්වයට විෂයානුබද්ධ විය හැකිය (මින්පසු ප්‍රතිඥා ලෙස හඳුන්වන). 69ඇ ඡේදයේ ව්‍යවහාර කිරීමේ අරමුණ සඳහා: |

| | |
|---|---|
| | (අ) අස්තිත්වයක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී හෝ ඊට පෙර ගිවිසුම් සමඟ එකඟවීමට අවශ්‍ය කෙරේ නම් 74.-75 ඡේදවල නිදර්ශනාත්මක ලෙස වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී එයට අයිතිය පවතින්නේද නැත්ද බලපානු ලබයි. වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව පමණක් ප්‍රතිඥා සමඟ එකඟවීම තක්සේරු කරන්නේ නම් වුවද වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී අයිතිය තිබේදැයි එවැනි ප්‍රතිඥාවක් බලපානු ලබයි. (උදාහරණ ලෙස වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී පමණක් එකඟවීම සඳහා තක්සේරු කර ඇති නමුත් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී මූල්‍ය තත්වය මත පදනම්ව ප්‍රතිඥාවක්).<br><br>(ආ) කාලපරිච්ඡේදය අවසානයෙන් පසුව පමණක් ප්‍රතිඥාවක් අස්තිත්වයක් සමඟ එකඟවීමට අවශ්‍ය කෙරේ නම් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී එම අයිතිය පවතිද යන්න බලනොපායි. (වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු මාස හයේ අස්තිත්වයේ මූල්‍ය තත්වය මත පදනම්ව ප්‍රතිඥාවක්). |
| 75අ | වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු අඩුම තරමේ මාස 12 සඳහා වගකීම පියවීම කල්දැමීමට අස්තිත්වයේ අයිතිය ක්‍රියාත්මක කරන බව විය හැකිවීම මගින් වගකීමක වර්ගීකරණය බලනොපායි. වගකීමක්, ජංගම නොවන ලෙස වර්ගීකරණය සඳහා 69 ඡේදයේ නිර්ණායක සම්පූර්ණ වන්නේ නම් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු අඩුම තරමේ මාස 12 තුල වගකීම පියවීමට කළමනාකරණය අදහස් කිරීම කරන්නේ නම් හෝ බලාපොරොත්තු වන්නේ නම් වුවද හෝ වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අනුමැතිය සඳහා දින අතර වගකීම පියවන්නේ නම් වුවද එය ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි. කෙසේනමුත් එවැනි තත්ත්වයන් තුළදී වුවද අස්තිත්වය අස්තිත්වයේ මූල්‍ය තත්ත්වය මත වගකීමේ බලපෑම හඳුනාගැනීමට එහි මූල්‍ය ප්‍රකාශන වල පරිශිලකයන් හැකිවන පියවීමේ වේලාව පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට අවශ්‍ය විය හැකිය (17 (ඇ) සහ 76 (ඇ) ඡේද බලන්න). |
| 76 | වාර්තාකරණ කාලපරිච්ඡේද අවසානයේ සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය දෙන ලද දිනය අතර පහත සඳහන් සිදුවීම් සිදු වන්නේ නම් ශ්‍රී. ලං.ගි.ප්‍ර - 10, *වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම්* අනුව නොගලපන සිද්ධි ලෙස එම සිද්ධි හෙළිදරව් කරනු ලැබේ:<br><br>(අ) ජංගම ලෙස වර්ගීකරණ කර ඇති වගකීමක දිගුකාලීන පදනම මත නැවත මූල්‍යකරණ කිරීම. (72 ඡේදය බලන්න);<br><br>(ආ) ජංගම ලෙස වර්ගීකරණය කරන ලද දිගුකාලීන ණය සැලසුමක කඩකිරීමක් නිවැරදි කිරීම (74 ඡේදය බලන්න);<br><br>(ඇ) ජංගම ලෙස වර්ගීකරණය කරන ලද දිගුකාලීන ණය සැලසුමක කඩකිරීමක් නිවැරදි කිරීමට සහන කාලයක් ණය දෙන්නා විසින් පිරිනැමීම (75 ඡේදය බලන්න); සහ<br><br>(ඈ) ජංගම ලෙස වර්ගීකරණය කරන ලද වගකීමක් පියවීම (75 ඡේදය බලන්න). |
| 76පඅ | 69-75 ඡේද ව්‍යවහාර කිරීමේදී ණය සැලසුමකින් පැන නගින වගකීම් වාර්තාකරණ කාලපරිච්ඡේදය පසු මාස 12 ක් තුළ ප්‍රතිඥා සමඟ අස්තිත්වය එකඟවීම යටත්ව එම වගකීම් පියවීම කල්දැමීමට අස්තිත්වයක අයිතිය වන විට ජංගම නොවන ලෙස අස්තිත්වයකට වර්ගීකරණය කළ හැකිය (72ආ (ආ) ඡේදය බලන්න). එවැනි අවස්ථාවලදී, පහත දෑ ඇතුලත්ව වාර්තාකරණ කාලපරිච්ඡේද පසු මාස 12 තුළ වගකීම නැවත ගෙවිය යුතු වන බව පත්වන බව අවදානම අවබෝධ කරගැනීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට හැකිවන ලෙස සටහන් තුල තොරතුරු හෙළිදරව් කළ යුතුය.:<br><br>(අ) ප්‍රතිඥා පිළිබඳ තොරතුරු (ප්‍රතිඥාවල ස්වභාවය ඇතුලත්ව සහ අස්තිත්වය ඒවා සමඟ එකඟවීමට අවශ්‍ය කෙරෙන විට) සහ ඒ සම්බන්ධිත වගකීම්වල ධාරණ අගය. |

| | |
|---|---|
| | (ආ) අස්තිත්වයට ප්‍රතිඥා සමග එකගවීමට අමාරු බව අගවන තිබේ නම් ඕනෑම සිද්ධි සහ තත්වයන්, - උදාහරණ විය හැකි කඩවීමක් අඩු කිරීමට හෝ වැළැක්වීමට වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල හෝ පසු අස්තිත්වය ක්‍රියාත්මක කර තිබීම. එවැනි සිද්ධි සහ තත්වයන් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සිද්ධි සහ තත්වයන් මත පදනම්ව එකග වීම සදහා තක්සේරු කරන්නේ නම් අස්තිත්වය ප්‍රතිඥා සමග එකගනොවනබව සිද්ධියද ඇතුලත් එවැනි සිද්ධි සහ තත්වයන්. |
| 76අ | ***පියවීම (69 (ආ), 69 (ඇ) සහ 69 (ඈ) ජේද*** <br> වගකීමක්, ජංගම හෝ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ අරමුණක් සඳහා පියවීම වගකීම ශූන්‍ය කිරීම තුළ ප්‍රතිඵල දෙන විරුද්ධ පාර්ශවයට මාරු කිරීම ලෙස අදහස් කෙරේ. මාරු කිරීම පහත සඳහන් දෑ තුළින් වීමට පුළුවනි: <br> (අ) මුදල් හෝ වෙනත් ආර්ථික සම්පත් උදාහරණ ලෙස භාණ්ඩ හෝ සේවා; හෝ <br> (ආ) 76 (ඇ) ජේදය භාවිත කරන්නේ නම් හැර අස්තිත්වයේ තමන්ගේ ස්කන්ධ උපකරණ |
| 76ආ | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 32 *මූල්‍ය සාධනපත්‍ර ඉදිරිපත් කිරීම* ව්‍යවහාර කරන්නේ නම් විරුද්ධ පාර්ශවයේ විකල්පයක් විය හැකි වගකීමක කොන්දේසි අස්තිත්වය තමන්ගේම ස්කන්ධ උපකරණ හුවමාරුව මගින් එහි පියවීම ප්‍රතිඵල දෙන බව ජංගම හෝ ජංගම නොවන ලෙස එහි වර්ගීකරණයට බලනොපායි. අස්තිත්වය සංයුක්ත මූල්‍ය සාධනපත්‍ර, ස්කන්ධ සංරචකයක් ලෙස වගකීමකින් එය වෙන්ව හඳුනාගනිමින් ස්කන්ධ උපකරණයක් ලෙස අස්තිත්වය විකල්ප වර්ගීකරණය කරයි. |
| 139ණ | 2020 ජනවාරි නිකුත් කළ ජංගම හෝ ජංගම නොවන ලෙස වගකීම්වල වර්ගීකරණය, 69, 73, 74 සහ 76 ජේද සංශෝධනය කරන ලද අතර 72අ, 75අ, 76අ සහ 76ආ ජේද අළුතින් එකතු කරන ලදී. අස්තිත්වයක් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 අනුව 2024 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා එම සංශෝධන අතීතානුයෝගීව ව්‍යවහාර කළ යුතුය. කලින් ව්‍යවහාර කිරීමට ඉඩ දෙනු ලැබේ. ප්‍රතිඥා සමඟ ජංගම නොවන වගකීම නිකුත් කිරීමට පසු කලින් කාලච්ඡේද සඳහා එම සංශෝධන ව්‍යවහාර කරන්නේ නම් (139ද ජේදය බලන්න) එම කාලපරිච්ඡේද සඳහා ප්‍රතිඥා සමඟ ජංගම නොවන වගකීම් ද ව්‍යවහාර කළ යුතුයි. පෙර කාලපරිච්ඡේද සඳහා ජංගම හෝ ජංගම නොවන ලෙස වගකීම වර්ගීකරණය අස්තිත්වය ව්‍යවහාර කරයි නම් එම කරුණු හෙළදරව් කළ යුතුය. |
| 139ද | 2022 ඔක්තෝම්බර් තුළ නිකුත් කළ ***ප්‍රතිඥා සමග ජංගම නොවන වගකීම්*** 60, 71, 72අ, 74 සහ 139ණ ජේද සංශෝධනය කරන ලද අතර 72ආ සහ 76පආ ජේද එකතු කරන ලදී. අස්තිත්වයක් පහත සඳහන් දෑ ව්‍යවහාර කළ යුතුය: <br> (අ) *ප්‍රතිඥා සමග ජංගම නොවන වගකීම්වල* නිකුත් කිරීම මත 139ණ ජේදය සංශෝධනය. <br> (ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 අනුව අතීතානුයෝගීව 2024 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා සියළුම වෙනත් සංශෝධන. කලින් ව්‍යවහාර කිරීමට ඉඩ දේ. අස්තිත්වයක් මෙම සංශෝධන කලින් කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කරයි නම් *ප්‍රතිඥා සමග ජංගම හෝ ජංගම නොවන ලෙස වගකීම්වල වර්ගීකරණය* කලින් කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කළ යුතුය. |

| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශ** | |
|---|---|
| 44ඊ | **සැපයුම්කරුගේ මූල්‍ය සැකසුම්**<br>අස්තිත්වයක් ද්‍රවශීලතා අවධානමට අස්තිත්වයේ නිරාවරණය මත අස්තිත්වයේ වගකීම් සහ මුදල් ප්‍රවාහ පදනම්ව එම සැකසුම්වල බලපෑම තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට හැකි *සැපයුම්කාර මූල්‍ය සැකසුම්* (44උ ඡේදයේ විස්තර කර ඇති) පිළිබඳ තොරතුරු හෙළිදරව් කල යුතුය. |
| 44උ | අස්තිත්වය ණයව සිටින එහි සැපයුම්කරුවන්ට මුදල් ගෙවීමට සහ සැපයුම්කරුවන්ට ගෙවීමට එදින හෝ ඊට පසු සැපයුම්වල කොන්දේසි සහ නියමයන්ට අනුව ගෙවීමට අස්තිත්වය එකඟවෙමින් මූල්‍ය සැලසුම් සැපයුම්කරුවන් එක්කෙනෙක් ඊට වඩා වැඩි දෙනෙක් විසින් පිරිනමමින් සැපයුම්කාර මූල්‍ය සැලසුම් ලක්ෂණගත කරයි. මෙම මූල්‍ය සැලසුම් ඒ සම්බන්ධිත ඉන්වොයිසිය සංසන්දනය කර කල්දමූ ගෙවීම් කොන්දේසි හෝ අස්තිත්වයේ සැපයුම්කරු කලින් ගෙවීම් කෝන්දේසි සඳහා ගෙවන දිනට අස්තිත්වයට පහසුකම් සපයයි. සැපයුම්කාර මූල්‍ය සැලසුම් නිතරම සැපයුම් දාම මූල්‍ය, ගෙවිය යුතු මූල්‍ය හෝ නැවත ණයට එකතු කිරීමේ පහසුකම් යනාදී ලෙස නිතරම හඳුන්වනු ලැබේ. අස්තිත්වය සඳහා තනිකරම ණය වැඩි කරන සැලසුම් (උදාහරණ ලෙස ඇපකරුවන් ලෙස භාවිතා කරන ණයවර ලිපි ඇතුලත් මූල්‍ය ඇපකර) හෝ සැපයුම්කරුවන්ට හෝ එහි ඇති මුදල සමග ඍජුවම අස්තිත්වය විසින් ගෙවීමට භාවිතා කරනු ලබන උපකරණ (උදාහරණ ලෙස ණය කාඩ්පත්) සැපයුම්කාර මූල්‍ය සැලසුම් නොවේ. |
| 44උ෧ | 44ඊ ඡේදයේ අරමුණ සම්පූර්ණ කිරීමට අස්තිත්වයක් එහි *සැපයුම්කාර මූල්‍ය සැලසුම්* සඳහා එකට හෙළිදරව් කළ යුතුය.:<br>(අ) (අ) සැලසුම්වල කොන්දේසි සහ නියමයන් (උදාහරණ ලෙස කල්දමූ ගෙවීම් කොන්දේසි සහ සපයනන ලද ආරක්ෂිත හෝ ඇපකර). කෙසේවෙතත් අස්තිත්වයක් කොන්දේසි සහ නියමයන් අසමානකම් තිබෙන බව සැලසුම්වල කොන්දේසි සහ නියමයන් වෙනමම හෙළිදරව් කළ යුතුය.<br>(අ) (ආ) වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේ සහ අවසානයේදී :<br>(i) සැපයුම්කාර මූල්‍ය සැලසුමක කොටසක් වන මූල්‍ය වගකීම්වල අස්තිත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කළ ධාරණ අගයන් සහ සම්බන්ධිත රේඛීය අයිතම.<br>(ii) මූල්‍ය සැපයුම්කරුවන්ගෙන් දැනටමත් සැපයුම්කරුවන්ට ලැබී තිබෙන ගෙවීම් (i) යටතේ හෙළිදරව් කළ මූල්‍ය වගකීම්වල ධාරණ අගයන් සහ සම්බන්ධිත රේඛීය අයිතම.<br>(iii) (i) යටතේ හෙළිදරව් කළ මූල්‍ය වගකීම් සහ සැපයුම්කාර මූල්‍ය සැලසුමක කොටසක් නොවන සැසඳිය හැකි වෙළඳ ගෙවිය යුතු මුදල් යන දෙකම සඳහා ගෙවීම ගෙවිය යුතු දිනයේ ගෙවන පරාසය (උදාහරණ ලෙස ඉන්වොයිසිය දින සිට දින 30 -40 කට පසු). සැසඳිය හැකි වෙළඳ ගෙවිය යුතු මුදල්වලට ව්‍යාපාරයේ එකම රේඛාව තුළ අස්තිත්වයේ වෙළඳ ගෙවිය යුතු මුදල් හෝ (i) යටතේ හෙළිදරව් කරන ලද මූල්‍ය වගකීම් ලෙස නඩු තීන්දු සඳහා උදාහරණ වේ. පරාසයේ ගෙවිය යුතු දිනයන් පුළුල් නම් අස්තිත්වයක් එවැනි පරාසයක් පිළිබඳ විස්තරාත්මක තොරතුරු හෝ අමතර පරාසයන් හෙළිදරව් කළ යුතුයි. (උදාහරණ ලෙස ස්ථිර පරාසයන්).<br>(ඇ) (අ) (i) යටතේ හෙළිදරව් කර ඇති මූල්‍ය වගකීම්වල ධාරණ අගයන් මූල්‍ය නොවන වෙනස්වීම්වල වර්ගය යන බලපෑම මූල්‍ය නොවන වෙනස්වීම්වලට උදාහරණ ලෙස ව්‍යාපාර සංයෝජනවල බලපෑම විනිමය වෙනස්වීම් හෝ මුදලේ හෝ මුදල් වලට සමාන දෑ භාවිතයට අවශ්‍ය නොවන වෙනත් ගණුදෙණු (43 ඡේදය බලන්න). |

| | |
|---|---|
| 62 | 2023 මැයි නිකුත් කළ *සැපයුම්කාර මූල්‍ය සැලසුම්* හි 44ඊ - 44උ ඡේද එකතු කරන ලදී. අස්තිත්වයක් 2024 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධන ව්‍යවහාර කළ යුතුයි. කලින් ව්‍යවහාර කිරීමට ඉඩ දෙනු ලැබේ. අස්තිත්වයක් පෙර කාලපරිච්ඡේද සඳහා එම සංශෝධන ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කළ යුතුය. |
| 63 | සැපයුම්කරු මූල්‍ය සැලසුම් ව්‍යවහාර කිරීමේදී, අස්තිත්වයක් පහත දෑ හෙළිදරව් කිරීමට අවශ්‍ය:<br>(අ) අස්තිත්ව පළමු වරට මෙම සංශෝධන ව්‍යවහාර කරන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ ආරම්භයට පෙර ඉදිරිපත් කරන ඕනෑම ව්‍රතාකරණ කාලපරිච්ඡේද සඳහා සන්සන්දනාත්මක තොරතුරු.<br>(ආ) අස්තිත්වය පළමු වරට මෙම සංශෝධන ව්‍යවහාර කරන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද ආරම්භයේදී 44උ(අ)(ii)–(iii) ඡේද මගින් එසේම නැතිනම් අවශ්‍ය කරන තොරතුරු.<br>(ඇ) අස්තිත්වය පළමු වරට මෙම සංශෝධන ව්‍යවහාර කරන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල ඉදිරිපත් කරන ඕනෑම අතුරු කාලපරිච්ඡේදය සඳහා 44ඊ–44උ ඡේද මගින් එසේම නැතිනම් අවශ්‍ය කරන තොරතුරු. |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර 12 - ආදායම් බදු** | |
| 4අ | ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන ආයතනයේ ප්‍රකාශයට පත් කළ කුළුණු දෙකේ රීතීන්වල විස්තර කරන ලද සුදුසුකම් ලත් දේශීය අවම ඉහළ බදු ක්‍රියාත්මක කරන ආදායම් බදු නීති ඇතුලත්ව එම රීතීන් ක්‍රියාත්මක කිරීමට පනවන ලද ආදායම් බදු නීතියෙන් හෝ සැලකිය යුතු ලෙස පනවන නීතියෙන් පැන නගින ආදායම් බදුවල මෙම ප්‍රමිතිය ව්‍යවහාර කරයි. එමගින් පැන නගින එවැනි ආදායම් බදු නීතිය සඳහා ආදායම් බදු කුළුණු දෙකේ නීති සම්පාදනය සහ කුළුණු දෙකේ ආදායම් බදු ලෙස හඳුන්වනු ලැබේ. මෙම ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට ව්‍යතිරේඛයක් ලෙස කුළුණු දෙකේ ආදායම් බදු යටතේ විලම්භිත බදු වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම හෝ හඳුනාගැනීම නොකළ යුතුය. |
| 88අ | **ජාත්‍යන්තර බදු ප්‍රතිසංස්කරණය - කුළුණු දෙකේ ආකෘතිමය නීති**<br>අස්තිත්වයක් කුළුණු දෙකේ ආදායම් බදුවලට සම්බන්ධව විලම්භිත වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු හඳුනා ගැනීමේ සහ හෙළිදරව් කිරීමේ ව්‍යතිරේඛය ව්‍යවහාර කර තිබෙන බව හෙළිදරව් කළ යුතුයි. (4අ ඡේදය බලන්න). |
| 88ආ | අස්තිත්වයක් කුළුණු දෙකේ ආදායම් බදු සම්බන්ධයෙන් එහි ප්‍රවර්තන බදු වියදම (ආදායම) වෙනමම හෙළිදරව් කළ යුතුය. |
| 88ඇ | කුළුණු දෙකේ සම්පාදනය පනවා තිබීම හෝ සැලකිය යුතු ලෙස පනවා තිබෙන නමුත් තවම ක්‍රියාත්මක නොවන කාලපරිච්ඡේදයක් තුළදී අස්තිත්වයක් එම සම්ප්‍රදායෙන් පැන නගින කුළුණු දෙකේ ආදායම් බදුවලට අස්තිත්වයේ නිරාවරණය මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් තේරුම් ගැනීමට උදව්වන ඇස්තමේන්තුගත තොරතුරු දත්ත හෝ සාධාරණය හෙළිදරව් කළ යුතු වේ. |
| 88ඈ | 88ඇ ඡේදයේ හෙළිදරව් කිරීමේ අරමුණ සම්පූර්ණ කිරීමට අස්තිත්වයක් වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයේදී කුළුණු දෙකේ ආදායම් බදුවලට එහි නිරාවරණය පිළිබඳව ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතුය. මෙම තොරතුරු කුළුණු දෙකේ සම්පාදනයන්වල සියළුම නිශ්චිත අවශ්‍යතාවයන් පිළිඹිබු කිරීමට නොතිබිය යුතු අතර දක්වන පරාසයක ආකාරයකින් සැපයීමට පුළුවනි. දන්නා |

| | |
|---|---|
| | හෝ සාධාරණ ඇස්තමේන්තු නොවන තොරතුරු ප්‍රමාණයට ඒ වෙනුවට අස්තිත්වයක් එම බලපෑමට ප්‍රකාශයක් හෙළිදරව් කළ යුතු අතර එහි නිරාවරණය තක්සේරු කරමින් අස්තිත්වයේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළිදරව් කරයි.<br><br>තොරතුරුවලට උදාහරණ 88ඇ - 88ඈ ඡේද විදහා දක්වන උදාහරණ අස්තිත්වයක් අරමුණු සම්පූර්ණ කිරීමට හෙළිදරව් කිරීම පුළුවන් වන අතර 88ඇ - 88ඈ ඡේදවල අවශ්‍යතාවයන් ඇතුලත් වන්නේ කුළුණු දෙකේ සම්පාදනය මගින් අස්තිත්වයට බලපානු ලබන්නේ කෙසේදැයි යන තොරතුරු සහ කුළුණු දෙකේ ආදායම් බදුවල නිරාවරණය විය හැකි ප්‍රධාන අධිකරණ බලයන් පිළිබඳව තොරතුරු වැනි ගුනාත්මක තොරතුරු සහ කුළුණු දෙකේ ආදායම් බදුවලට යටත් වන අස්තිත්වයේ ලාභයේ කොටසේ ඇඟවීමක් සහ එම ලාභයන්ට බලපාන සාමාන්‍ය සඵලදායී ආදායම් බදු අනුපාතය හෝ කුළුණු දෙකේ සම්පූර්ණයෙන් බලපා තිබේ නම් අස්තිත්වයේ සාමාන්‍ය සඵලදායී ආදායම් බද්ද වෙනස්වන්නේ කෙසේදැයි ඇඟවීමකි. |
| 98ක | 2023 මැයි මස නිකුත් කළ *ජාත්‍යන්තර ආදායම් බදු ප්‍රතිසංස්කරණ* - කුළුණු දෙකේ ආකෘති රීතීන් 44 සහ 88අ-8ඈ ඡේද එකතු කරන ලදී. අස්තිත්වයක්:<br><br>(අ) මෙම සංශෝධන නිකුත් කළ වහාම 44 සහ 88 අ ව්‍යවහාර කරන අතර ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 අනුව අතීතානුයෝගීව ව්‍යවහාර කළ යුතුයි; සහ<br><br>(ආ) 2023 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භවන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා 88ආ-88ඈ ඡේද ව්‍යවහාර කළ යුතුයි. 2023 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර ඕනෑම අතුරු කාලපරිච්ඡේද සඳහා මෙම ඡේදය මගින් අවශ්‍ය තොරතුරු හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ. |

| |
|---|
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 - දේපල, පිරියත සහ උපකරණ** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 19 - සේවක ප්‍රතිලාභ** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 20 - රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 21 - විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම්වල බලපෑම** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 23 - ණය ගැණුම් පිරිවැය** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 26 - විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 27 - වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 28 - ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන** |
| වෙනස්කම් නොමැත |

| |
|---|
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 29 - අති උද්ධමනකාරි ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරණය** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 32 - මූල්‍ය සාධන පත්‍ර : ඉදිරිපත් කිරීම** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 33 - කොටසක ඉපැයුම්** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 34 - අතුරු මූල්‍ය වාර්තාකරණය** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 - වත්කම් හානිකරණය** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 37 - ප්‍රතිපාදන, අසම්භාවය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 38 - අස්පෘශ්‍ය වත්කම්** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39 - මූල්‍ය සාධන පත්‍ර : හඳුනා ගැනීම සහ මැනීම** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 40 - ආයෝජන දේපළ** |
| වෙනස්කම් නොමැත |
| **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 41 - කෘෂිකර්මය** |
| වෙනස්කම් නොමැත |

EOG 04- 0126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණයකරන ලදී.